ජා-ඇල ප්‍රාදේශීය සභාව
------------------------
ගම්පහ දිස්ත්‍රික්කය
--------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූලි 31 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 21 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජා-ඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුද්දර ආදායම මුදල් පදනමට ගිණුම්ගත කරන බව ගිණුම් ප්‍රතිපත්තිවල සඳහන් තිබුණද උපචිත පදනමට ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම හා ණය ගැතියන් රු.69,181,083 ක් බැගින් වැඩියෙන් දක්වා තිබුණි. | හෙළිදරව් කරන ලද ගිණුම් ප්‍රතිපත්ති මත ගිණුම් තැබීම කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 දෙසැම්බර් 31 දිනට උප කාර්යාල 04 ක ඖෂධ මධ්‍යස්ථානවල රු.94,825 ක් වටිනා ඖෂධ තොග ගිණුම් ගත කර නොතිබුණි. | වර්ෂ අවසාන තොගය ගිණුම්වලට ගැලපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කොම්පෝස්ට් අංගනයට පාලන යන්ත්‍රයක් ලබාගැනීම වෙනුවෙන් රු.5,265,000 ක් ගෙවියයුතු වුවද ණයහිමියන් ලෙස රු.4,875,000 ක් ගිණුම් ගත කර තිබුණි. | බැරකම්වල නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | පොදු තැන්පත් ගිණුමට බැර කර තිබූ රු.1,648,498 ක් වූ ගලි බැහැර කිරීමේ ගාස්තු ආදායමට ගෙන නොතිබුණි. | ආදායම් ප්‍රභවයන් නිවැරදිව හඳුනාගෙන වර්ෂයේ ආදායමට ගැලපිය යුතුවේ. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |
| (ඇ) | සභාව සතු නොවන කඩ සඳහා අයවිය යුතු රු.686,137 ක් වෙනත් ආදායම් ශිෂ යටතේ ගිණුම් ගත කර තිබුණි. | සභාව සතු වත්කම්වලින් ජනිත ආදායම පමණක් ගිණුම්ගත කළ යුතුවේ. | ශිෂ බදුකුලී ගිණුමෙහි රු.686,137 ක් සභාව සතු නොවන කඩ සඳහා බව දන්වමි. |
| (ඉ) | භෞතික තොග ශේෂය ගිණුම්වලට ගැලපීම් නොකර, රු. 53,975,723 ක තොග ලෙජර ශේෂය ගිණුම්ගත කර තිබුණි. | භෞතික තොගය ගිණුම්ගත කිරිමට පියවර ගත යුතුවේ. | නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| (ඊ) | 2019 ජූලි 01 දින ගබඩාවට ලැබී තිබූ රු.402,500 ක් වූ වතුර මෝටරය ප්‍රාග්ධනිත කර නොතිබුණි. | වත්කම් ප්‍රාග්ධනිත කිරිමට කටයුතු කළ යුතුවේ. | 2020 අවසන් ගිණුම මගින් නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1.3.3 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 05 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර 2019 දෙසැම්බර් 31 දිනට රු.390,684,503 ක වෙනසක් පැවතුණි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1.3.4 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දිගින් දිගටම පැවත එන රු. 6,927,135 ක ගිණුම් ශේෂ 08 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට වූ රු.40,641,900 ක විවිධ ණයහිමි ශේෂය සඳහා කාල විශ්ලේෂණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. | කාලවිශ්ලේෂණයක් මගින් විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.3.6 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2000 වර්ෂයේ සිට පැවත එන නිරවුල් නොකළ අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.236,425 ක් විය. | නිරවුල් කිරීමට පියවර ගත යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | | |
| (i) මුදල් රෙගුලාසි 371(2) | 762,700 | 2019 දෙසැම්බර් 18 දින කායවර්ධන තරගාවලිය සඳහා ලබාගත් රු.762,700 ක අත්තිකාරම් මුදල නිරවුල් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කඩිනමින් නිරවුල් කරන බව දන්වමි. |
| (ii) මුදල් රෙගුලාසි 571 | 135,709,827 | වසර 10 ඉක්මවා තිබූ රු.135,709,827 ක තැන්පත් ශේෂ හඳුනා ගෙන නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව තැන්පතු ශේෂ හඳුනාගෙන නියාදනය කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 880 | - | ඇප ලබා ගත යුතු නිළධාරින් 08 දෙනෙකුගෙන් ඇප ආඥා පනත අනුව තැන්පත් මුදල් ලබා ගෙන නොතිබුණි. | අදාළ නිළධාරින්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ. | ඇප ලබා ගැනීමට කඩිනමින් කටයුතු කරමි. |
| (ආ) | 2018 ජුලි 19 දිනැති අංක 2018/e-Local Government-01 දරන බස්නාහිර පලාතේ පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | - | අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට හා ගෙවීම් සිදු කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව පුරවැසියන්ට පහසුකම් සැලසීමට කටයුතු කළ යුතුවේ. | විධිමත්ව සැකසීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා බව දන්වමි. |

2. මූල්‍ය සමාලෝචනය
---------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 137,137,461 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 183,525,635 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
--------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. | 000` රු. |
| (i) | වරිපනම් හා බදු | 82,519 | 55,044 | 54,742 | 21,896 | 45,660 | 51,061 | 50,137 | 25,481 |
| (ii) | කුලී | 17,434 | 11,137 | 6,993 | 8,782 | 16,702 | 14,422 | 11,397 | 10,968 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,010 | 2,305 | 2,305 | - | 1,755 | 2,067 | 2,067 | 93 |
| (iv) | වෙනත් ආදායම් | 202,244 | 164,458 | 164,458 | 914 | 129,561 | 250,065 | 229,860 | 889 |
| | | 305,207 | 232,944 | 228,498 | 31,592 | 193,678 | 317,615 | 293,461 | 37,431 |

2.2.2 කුලී

----

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ---------- | --------------------------- |
| (අ) | රාගම සතිපොළ 2019 වර්ෂය සඳහා ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් නොවීම නිසා රජයේ තක්සේරුව වූ රු.3,000,000 වඩා අඩු වූ රු.2,199,429 කට ගිවිසුම් ගත වීමකින් තොරව බදුදී තිබූ අතර බදුකරු විසින් සභාව වෙත මාසික බදුකුලි ගෙවා නොතිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට හිඟ බදුකුලිය රු.1,281,125 ක් වූ අතර මාසිකව බදුකුලී නොගෙවීම සම්බන්ධයෙන් බදුකරුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව කටයුතු කළ යුතු අතර හිඟ අය කර ගත යුතුවේ. | සතිපොළෙහි සීමාව තීරණය කරන තෙක් සහා සම්මුතියෙන් 2018 වර්ෂයේ බදුකරුටම ලබාදුන් අතර හිඟ මුදල් අයකර ගැනීමට නීතිමය කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | රාගම හා කඳාන පොදු වෙළඳ පොලේ මස් වෙළඳසැල් පිළිවෙලින් 03 ක් හා 02 ක් 2019 වර්ෂය සඳහා ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැරව ගිවිසුම්ගතවීමකින් තොරව ලබාදී තිබූ අතර හා 2018 වර්ෂය සඳහා එම රු.8,473,590 ක හිඟ බදු මුදල් අයවී නොතිබියදී සහා තීරණයක් මත ඔවුන් වෙතම ලබාදී තිබුණි. තවද 2019 වර්ෂය සඳහා හිඟ බදු මුදල වූ රු.29,294,407 ක් අය වී නොතිබීම සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව බදු ලබාදීමට හා හිඟ බදු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා මස් කඩ ටෙන්ඩර් කර නොමැති අතර 2018 වර්ෂයේ හිඟ අයකර ගැනීමට නීතිමය කටයුතු කරමි. |

2.2.3 වෙනත් ආදායම්

-----------------

2.2.3.1 මුද්දර ගාස්තු

--------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------- | ------------ | ---------------------- |
| ගම්පහ, ගම්පොල හා මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් 2018 හා 2019 වර්ෂ සඳහා හඳුනාගෙන තිබූ රු.268,333,636 ක මුද්දර ගාස්තු 2020 ජූනි වන විටත් අයකරගෙන නොතිබුණි. | හඳුනාගෙන ඇති මුද්දර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදාල කාර්යාලවලින් අයවිය යුතු මුද්දර ගාස්තු ආදායම් සඳහා ඇතැම් උපලේඛන පළාත් ආදායම් කොමසාරිස් වෙත යොමුකර ඇති අතර ඇතැම් ලේඛන සකස් වෙමින් පවතින බව දන්වමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කාර්ය සාධනය

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

3.1.1 වාර්ෂික කාර්ය සාධන සැලැස්ම
----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික කාර්ය සාධන සැලැස්මේ සඳහන් දේපල වසර 05 කට වරක් තක්සේරු කිරීම,මාර්ග ලේඛනයක් සකස් කිරීම, අයදුම්පත්වල ගැටළු සම්බන්ධයෙන් දින 05 ක් ඇතුළත අදාල පුද්ගලයන්ට දැනුම් දීම හා සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම යන කාරණා ඉටු කර නොතිබුණි. | වාර්ෂික කාර්ය සාධන සැලැස්ම ප්‍රකාර ක්‍රියාකාරකම් ඉටු කිරීමට කටයුතු කළ යුතුවේ. | නිවැරදි කිරීම් සිදුකර ඉදිරියේදී විධිමත් ලෙස අවශ්‍ය කටයුතු කරන බව දන්වමි. |

3.2 කළමනාකරණ දුර්වලතා
--------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දේශීය ණය හා සංවර්ධන අරමුදල මගින් වාරික 20 කින් ගෙවා නිම කිරීමේ පදනම මත රු.6,280,000 ක් වූ මයික්‍රෝ කැබ් රථයක් ලබාගෙන තිබූ අතර එය මිලදී ගත් දින සිටම විවිධ දෝෂයන්ට ලක්වන බව දක්වා තිබුණි. භාවිතා කළ වසර 10 ක් සඳහා වාහනයේ වටිනාකමින් සියයට 45 ක් හෙවත් රු.2,854,594 ක් අලුත්වැඩියාවන් සඳහා වැයකර තිබූ අතර ධාවන සටහන් අනුව ධාවනය කර තිබුණේ වසර 02 යි මාස 04 ක කාලයක් පමණි. | මිලදී ගැනීමේදී ආර්ථික භාවය පිළිබඳව දැඩි විමසිලිමත් බවින් කටයුතු කළ යුතුවේ. | භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව වාහන විකුණා නව වාහනයක් මිලදී ගැනීමට අවසර නොදෙන බැවින් වාහන දෝෂ හා අධික නඩත්තු වියදම් යටතේ භාවිතා කරමින් පවතින බව දන්වමි. |

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
-------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2006 වර්ෂයේ වෙන්දේසි ආයතනයක් විසින් ඉඩමක් කොටස් කර විකිණීමේදී එහි අනුමත කිරීමේ කොන්දේසි ප්‍රකාරව පොදු පහසුකම් සඳහා සභාවට ලැබිය යුතු පර්චස් 40 කින් යුතු ඉඩම ඔප්පුවක් මගින් සභාවට පවරා ගෙන නොතිබුණි. | ප්‍රාදේශිය සභාවට හිමිවිය යුතු ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුවේ. | ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට නීතිමය කටයුතු සිදු කරමින් පවතින අතර නීතිමය වශයෙන් ලියවිලි ඉදිරිපත් කිරීම හේතුවෙන් වරිපනම් අංකයක් ලබා දීමට කටයුතු කර ඇති බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ස්ටාටන් එස්ටේට් ඉඩම කට්ටි කර විකිණීමේදි අක්කර 10 ක භූමි ප්‍රමාණයක් පොදු කටයුතු සඳහා වෙන්වී 1986 ප්‍රාදේශීය සභාව පිහිටුවීමේදී එම පොදු ඉඩම පවරා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එය බාහිර පාර්ශවයන් විසින් අත්පත් කර ගෙන තිබුණි.මේ වන විට පෞද්ගලික ආයතනයක් විසින් භුක්ති විදින මෙම ඉඩමෙන් පර්චස් 69 ක් ප්‍රාදේශීය සභාවට පවරා දීමට එකඟ වී තිබුණද එම බිම් ප්‍රමාණය හෝ පවරා ගෙන නොතිබුණි. | ප්‍රාදේශිය සභාවට හිමිවිය යුතු ඉඩම්වල අයිතිය තහවුරු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුවේ. | 1963 දී අංක 759/63 දරන පිඹුරෙන් අක්කර 10 ක පමණ බිම් කොටස් සභාවට වෙන්කර තිබුණද පවරා දී නොමැති පර්චස් 67.05 ක කොටසක් ලබාදීමට පෞද්ගලික ආයතනය එකඟවී ඇති බව දන්වමි. |
| (ඇ) | මාර්ග නඩත්තු සඳහා 2018 ජනවාරි සිට 2019 ජූලි මස දක්වා ඇස්තමේන්තු නොමැතිව රු.35,681,094 ක ද්‍රව්‍ය නිකුත් කර තිබුණි. | ඇස්තමේන්තු සකස් කිරිමකින් තොරව ද්‍රව්‍ය නිකුත් නොකිරීමට කටයුතු කළ යුතුවේ. | වර්තමානයේ ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු සකස් කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය
----------------------------

3.4.1 භාණ්ඩ සමීක්ෂණය
----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව සොයා ගත නොහැකි දේපල සංඛ්‍යාව 38 ක්, දුම්රිය පල පාර පොදු නාන ළිඳ භෞතිකව නොතිබීම හා එහි නිවසක් ඇති බව සහ බටුවත්ත උප කාර්යාලයට අයත් හිඩවකගහවත්ත හා ගොඩපරගහවත්ත පර්චර්ස් 42.45 ක ඉඩම සොයා ගත නොහැකි බව වාර්තා කර තිබූ නමුත් මේ සම්බන්ධයෙන් සභාව මෙතෙක් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | සභාව සතු දේපලවල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීමට කඩිනමින් පියවර ගත යුතුවේ. | වත්කම් අඩුවීම සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව දන්වමි. |